# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2343/04 - 2023 ජූලි මස 31 වැනි සඳුදා - **2023.07.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කැල/16/ඉඅ/209(ii).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්හේන ගමේ පිහිටි, ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක කැ.සි. 511602 කලාප අංක 05 පත්‍ර අංක 01 සහ 2023.03.17 දිනැති මූලික පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0251 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 01 (එක)ට මායිම් :

**කැබලි අංක 01**

ඉඩමේ නම : අර්බන්වත්ත *නොහොත්* පොල්හේනවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය : පාර; හිමිකම් කියන්නා : අංක 368/2, දෙවන පටුමග, පොල්හේන, කැලණිය ලිපිනයේ පදිංචි ඉම්ආරච්චිලෑ අජන්ත කුමාර සහ අංක 380, දෙවන පටුමග, පොල්හේන, කැලණිය ලිපිනයේ පදිංචි ආඩිගොඩගේ විමලසිරි ගුණවර්ධන; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0251 (පර්චස් 9.9)

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.08.31 වැනි දින පෙ.ව. 9.30 ට කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023.08.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ඒ.ඒ.ඩී.සී. නදීෂානි අමරසිංහ**,**
ප්‍රාදේශීය ලේකම්,
කැලණිය.

2023 ජූලි මස 24 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0284

1A - G 040000 – 14 (2023/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*